**පස්ගොඩ ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවල ක්‍රියාත්මක නොකරන ලද වටිනාකම රු.205,000 ක්වූ ඉදිකිරීම් කර්මාන්ත 05 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එක් ඉදිකිරීමක් 2024 වර්ෂය තුළ අවසන් කිරිමට කටයුතු කරන බවත්, රු.25,000 බැගින් වෙන් කරන ලද කර්මාන්ත 04 සඳහා එම මුදල් ප්‍රමාණවත් නොවන බැවින් එම මුදලින් අදාළ ප්‍රදේශවල සිලින්ඩර් ලබා දීමට කටයුතු යොදා ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාව සතු මාවරල සති පොළ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කරන ලද රු.429,829 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | රු.429,829 ක වැට් වියදම 2024 වර්ෂයේදී ජ'නල් සටහන් අංක 2 මඟින් ප්‍රාග්ධනිත කරන ලද බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | රු.355,742 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 40 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.28,171,334 ක් වූ ගිණුම් විෂයන් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් කල් ඉකුත් වූ එකතුව රු258,746 ක තැන්පතු ශේෂ 34 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල තැන්පතු හිමියන් දැනුවත් කර තැන්පතු මුදල් ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.12,724937 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.31,630,036 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,956,600 | 2,282,625 | 2,532,302 | 262,606 | 1,991,500 | 2,335,586 | 1,910,523 | 512,283 |
| (ii) | කුලී | 9,846,960 | 9,712,368 | 9,929,263 | 458,575 | 10,883,760 | 7,256,696 | 7,886,314 | 675,470 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 751,200 | 1,104,040 | 1,165,478 | 134,000 | 821,150 | 1,042,543 | 981,105 | 195,438 |
| (iv) | වෙනත් ආදායම් | 7,445,650 | 11,037,144 | 10,991,448 | 788,511 | 4,421,200 | 6,682,253 | 6,141,871 | 742,815 |
| | | 21,000,410 | 24,136,177 | 24,618,491 | 1,643,692 | 18,117,610 | 17,317,078 | 16,919,813 | 2,126,006 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන අංක 2284 හා 2022 ජුනි 10 දිනැති ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර වසර 1 ½ කට අධික කාලයක් ගතවී තිබුණ ද දේපල තක්සේරු කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි වරිපනම් තක්සේරුව ආරම්භ කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු වෙළෙඳ සංකීර්ණ 07 හි කඩ කාමර 93 න් 91 ක් බදු දී තිබූ අතර, ඉන් කඩ කාමර 23 කින් රු.456,075 ක කඩ කුලී අයවිය යුතුව පැවතුනි. ඉන් රු.5,000ට වැඩි ශේෂ වටිනාකම රු.448,560 ක් විය. | කඩ කාමර 03 ක අයිතිය ඇති බදුකරුවෙකුගෙන් රු.336,287 ක් ද, කඩ කාමර 03 ක් සඳහා රු.6,837 ක් ද අය වීමට ඇති බවත්, අදාළ බදුකරුවන්ට එරෙහිව නඩු පවරා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | ඌරුබොක්ක වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක කඩකුලී මාස 22 ත් 24 ත් අතර කාලසීමාවක සිට කුලී ගෙවීම නතර කිරීමෙන් රු.336,287 ක ශේෂයක් අය විය යුතුව තිබුණි. | ගෙවීම් පැහැරහැර ඇති එක් ගැනුම්කරුවෙකු සතු කඩ කාමර 03 සඳහා නඩු පවරා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 05 වන ඡේදය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 22 ක ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබීමෙන් කාල සීමාව ඉකුත්වී වසර 01 යි මාස 06 ක කාලයක් ගතවී තිබුණි. එසේම ඉහත චක්‍රලේඛයේ 11 ඡේදයේ විධිවිධාන වලින් බැහැරව සභාව සතු වෙළෙඳ සංකීර්ණ 02 ක කඩ කාමර 22 ක් බදුගෙන තිබූ බදුකරුවන් විසින් අධික කුලියක් මත වෙනත් පාර්ශවයන්ට කඩ කාමර අතුරු බදු දී තිබුණි. | නව තක්සේරු බදු මුදල් සමඟ එකඟ නොවීම නිසා නව ගිවිසුමකට එළඹීමට බදුකරුවන් අකමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් බදු ගිවිසුම් යාවත්කාලීන කර ගැනීමට නොහැකි වී ඇති බව හා වෙළඳ සංකීර්ණ ඉදිකිරීමේදී පෙර ගෙවුම් පදනම මත ටෙන්ඩර් ක්‍රමයට කඩ කාමර බදු දීම සිදු කරනු ලබන බැවින් ධනවත් ව්‍යාපාරිකයින් ටෙන්ඩර් ඉදිරිපත් කර අමතර ආදායමක් ඉපයීම සඳහා කඩ කාමර ලබා ගන්නා බවත්, ඔවුන් විසින් මාසික වාරික මුදල් ගෙවා ඇති බැවින් සභාවට පාඩුවක් වී නොමැති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.986,119 ක් හා මුද්දර ගාස්තු රු.17,389,714 ක් විය. | උසාවි දඩ මුදලින්රු. 982,119 ක් හා මුද්දර ගාස්තු මුදලින් රු.12,488,881 ක් 2024 අප්‍රේල් 24 දින වනවිට ලැබී ඇති බවත්, ඉතිරි රු.4,000 ක උසාවි දඩ මුදල හා දීර්ඝ කාලීනව හිඟව පවතින මුද්දර ගාස්තු වටිනාකම් ඉදිරියේ දී කපා හැරීමට කටයුතු කිරීමට නියමිත බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව කටයුතු කර සභා බලප්‍රදේශය තුළ සිදු කරනු ලබන ඉදිකිරීම් වෙනුවෙන් ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා ඉඩම් අනුබෙදුම් කිරීම සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ විධිවිධාන ඇතුලත් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් සියලුම පළාත් පාලන ආයතනවලට පොදුවේ සකස් කර පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබූ අතුරු ව්‍යවස්ථාව ලැබුණු වහාම සභාවට ගැලපෙන පරිදි අතුරු ව්‍යවස්ථාව සකස් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කර අතුරු ව්‍යවස්ථා කඩිනමින් පනවා ගත යුතුය. |
| (ආ) | සභා බලප්‍රදේශයේ දෛනිකව එකතු කරනු ලබන දිරන කසල බොරලම්පොත අක්කර ¼ ක පමණ භූමිය වෙතට බැහැර කර කොම්පෝස්ට් නිෂ්පාදනය කර තිබුණ ද කොම්පෝස්ට් අංගනයෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොවීමත්, ආවරණය කරන ලද ගොඩනැගිල්ලක් නොමැති වීමත් නිසා කොම්පෝස්ට් නිෂ්පාදනය කාර්යක්ෂමව සිදු නොවන බව නිරීක්ෂණය විය. සභා බලප්‍රදේශය තුළ එක්රැස් කරනු ලබන නොදිරන කසල බැහැර කිරීම සඳහා සභාව විසින් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකර කොම්පෝස්ට් අංගනය පිහිටි භූමියට බැහැර කර පස් දමා යට කිරීම සිදුකර තිබුණි. | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අනුමැතිය ලැබී ඒ සඳහා ඇස්තමේන්තු හා සැලසුම් සකස් කිරීමට තාක්ෂණික නිලධාරී වෙත යොමු කර ඇති බවත්, පිලිස්සීම හෝ පසට යට කිරීම හැර නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා විකල්පයක් යෝජනා වී නොමැති බවත්, කසළ කළමණාකරණය සඳහා ඉඩමක් ලබා ගැනිමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් සුදුසු ඉඩමක් ඉල්ලා ඇති බව. | විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් ක්‍රියාත්මක කරන කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා 2024 ජනවාරි 22 වන විටත් මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | සභාව විසින් කසළ කළමණාකරණ කටයුතු හා කාබනික පොහොර නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා ඉඩමේ අයිතිය සභාව සතුව නොමැති බැවින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට නොහැකි වී ඇති බව. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට ද කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ කොට්ඨාශ 16 ට අදාළව මාර්ග 515 ක් මැනුම් කිරීමේ කටයුතු අවසන් කර තිබුණු නමුත් එම මාර්ග සිතියම්ගත කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්ති ප්‍රකාරව 2001 වර්ෂයෙන් පසු මාර්ග නාම ලේඛණය ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 ජනවාරි 19 දින වන විට කොට්ඨාශ 16 ට අදාළ ව මාර්ග 661 ක් මැනුම් කර, 2024 මාර්තු 05 දින වන විට ඉන්වෙන්ට්‍රිගත කර අවසන් කරන ලද බවත්, මාර්ග සිතියම්ගත කිරීම 2024 ජුනි 30 වන විට අවසන් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 28(1) වගන්තියේ විධිවිධානවලින් බැහැරව සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව සභා බලප්‍රදේශයේ නාගරික සීමාවට අයත් ඌරුබොක්ක ගින්නලිය මාර්ගයේ දෙමටවලහේන නැමැති ස්ථානයේ ගොඩනැගිලි සීමාවන් උල්ලංඝනය කරමින් වර්ග මීටර් 168.67ක දෙමහල් වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර, ඊට අමතරව ඉදිකර තිබූ නව ගොඩනැගිලි 02 ක් සඳහා සංවර්ධන බලපත්‍ර ලබාගත් බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අඩි 50 සීමාව නොමැති බැවින් නියමිත කොන්දේසිවලට අනුකූලව සැලසුම සංශෝධනය කර නැවත ඉදිරිපත් කරන ලෙසට අයදුම්කරුට දන්වා යවා ඇතත් ඔහු විසින් සැලසුම සංශෝධනය කර මේ වන තෙක් ඉදිරිපත් කර නොමැති බව. | රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | පස්ගොඩ - ඌරුබොක්ක ප්‍රධාන මාර්ගය මධ්‍යයේ සිට අඩි 50 ක මාර්ග රක්ෂිතය තුළ ඉදිකළ නේවාසික වාණිජ ගොඩනැගිල්ලට අදාල අයදුම්පත සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිර්වන්දි ගිවිසුමකට එළඹෙන ලෙස දන්වා තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන ඉදිකිරීම් සිදුකරමින් තිබුණි. තවද අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබූ ගොඩනැගිලි සැලැස්ම අනුව බිම් මහලේ ප්‍රමාණය වර්ග මීටර් 200.37 ක් වූ නමුත් එම සැලැස්මට අනුකූල නොවන පරිදි වර්ග මීටර් 214.5 ක බිම් මහල ඉදි කර තිබුණි. | නිර්වන්දි ගිවිසුමකට යටත්ව අදාල ගොඩනැගිලි අයදුම්පත අනුමත කිරීම සඳහා ඉදිරියේ කටයුතු සිදු කරන බවත්, බිම් මහලේ වෙනස් වූ වර්ග ප්‍රමාණය සඳහා නව සැලැස්මක් ඉදිරිපත් කළ පසු දඩ මුදලකට අය කිරීමටත් කටයුතු කරන බව. | අනවසර ඉදිකිරීම් විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභා බලප්‍රදේශය තුළ 2016 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුළ ගොඩනැගිලි අයදුම්පත් 39 ක් අනුමත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර ලබා දී වසර 04 ත් 07 ත් අතර කාලයක් ගතවී තිබූ නමුත් ඉන් ගොඩනැගිලි 05 කට පමණක් අනුකූලතා සහතික ලබා ගෙන තිබුණි. එය අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 12 ක් විය. | අනුකූලතා සහතික ලබා දිය හැකි මට්ටමට ඉදිකිරීම්වල වැඩ අවසන් කර නොතිබීම හේතුවෙන් අනුකූලතාවය ලබා ගන්නා පිරිස අඩු වී ඇති බවත්, අනුකූලතාවය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන සංඛ්‍යාව වැඩි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ඉදිකිරීම්වලට අදාලව අනුකූලතා සහතික ලබා ගත යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික සම්මේලනයකට සහභාගී වීම සඳහා නිලධාරීන් 06 දෙනෙකුට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 76,200 ක් කිසිදු නෛතික ප්‍රතිපාදනයක් සලසා නොතිබියදීත් ක් බාහිර පාර්ශවයක් වෙත සභා අරමුදලින් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ 25වන පරිච්ඡේදයේ 02වන වගන්තියට හා තවත් කොන්දේසි 05කට යටත්ව අදාල සම්මේලනයට සහභාගී වීම සඳහා නිදහස් ගමන් බලපත් පහසුකමට සමාන මුදලක් පුද්ගලික බස් රථවලට ලබා දීමට දකුණු පළාත් ආණ්ඩුකාරවර විසින් ලබා දී තිබූ අනුමැතිය මත පදනම්ව කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 අප්‍රේල් 25 දින සිට 2023 නොවැම්බර් 16 දින දක්වා කාල පරිච්ඡේදය තුළ දී සභාව විසින් රු.760,055 ක වටිනාකමක් සහිත ප්‍රසම්පාදන කමිටු තීරණ 18 ක් ගෙන තිබුණ ද, එම තීරණවලට අදාල වාර්තා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් අත්සන් යොදා පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන තීරණ පොතෙහි නිලධාරීන්ගේ අත්සන සහිතව තීරණ සටහන් කිරීමට කටයුතු කරන බව. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.271,768 ක් වැය කර 225/75/16PR වර්ගයේ ටයර් 04 ක් මිලදී ගැනීම සඳහා මිල කැඳවීම් ලිපි යොමු කළ ලියාපදිංචි සැපයුම්කරුවන් 05 දෙනෙකුගෙන් 02 දෙනෙකු වෙතින් පමණක් මිල ගණන් ලැබී තිබූ බවත් සඳහන් කර තිබුණද ඊට අදාල තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොවීය. | ටයර් මිලදී ගැනීම්වලට අදාළ ලිපිගොනුව අස්ථානගතවී ඇති බවත්, ඉදිරියේදී එවැනි අතපසුවීම් මගහරවා ගැනීමට කටයුතු කරන ලෙස විෂය නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව. | ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයකින් සිදු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් තිදෙනෙකු හා ආදේශක සෞඛ්‍ය කම්කරුවෙකු වෙත තනතුරට නියමිත රාජකාරි වෙනුවට වෙනත් රාජකාරි පවරා වැටුප් හා දීමනා ලෙස රු.1,854,315 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. | සේවා අවශ්‍යතාවය මත රියදුරු තනතුර හා බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා ද, බෙංගමුව උප කාර්යාලයෙහි සහාය කටයුතු සඳහා ද වැඩ/ක්ෂේත්‍ර කම්කරුවන් තිදෙනෙකු යොදවා ගෙන කටයුතු පවත්වාගෙන ගිය බවත්, ඔවුන් විසින් පවරන ලද තනතුරට අදාළ රාජකාරී මනාව ඉටු කරන ලද බැවින් ඔවුන් වෙනුවෙන් වැටුප් ගෙවීම සිදු කරන ලද බව. | තනතුරුවලට අදාල රාජකාරි පැවරිය යුතුය. |
| (ආ) | දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී පවතින මියගිය හා විශ්‍රාම ගිය සේවකයන් දෙදෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.152,611 ක ආපදා ණය ශේෂයක් පැවතුණි. | මිය ගිය සේවකයකයාගේ රු.9,663 ක ණය මුදල කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරගේ අනුමැතියට යොමු කර ඇති බවත්, විශ්‍රාම ගිය සේවකයාගේ රු.142,948 ක ණය සම්බන්ධයෙන් මු.රෙ. 104 පරීක්ෂණයක් සිදු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අදාළ මුදල අය කර ගැනීම සඳහා ලිඛිත දැනුම්දීම් සිදු කර ඇති බව. | කඩිනමින් අය නොවී පවතින සේවක ණය ශේෂ අයකළ යුතුය. |